සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 08 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය

නම / විභාග අංකය ................................ කාලය: පැය 02 යි.

### I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. I කොටසේ ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා, II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

- ඉරි ඇඳි පදවලට වඩාත් ම සමීප අර්ථය කුමක් ද?

(01) ජාවාරම්කරුවෝ <u>ඉවක් බවක්</u> නැතිව වනය විනාශ කරති.

(1) උදව් ඇතිව (2) රහසිගතව

(3) අපරීක්ෂාකාරීව (4) නොසැලකිල්ලෙන්

(02) <u>අරෝවක්</u> නැතිව බොහෝ දෙනෙක් සිරිපාදය කරුණා කරති.

(1) කරදරයක් (2) ලෙහෙසියෙන්

(3) උත්සාහයෙන් (4) අවබෝධයෙන්

(03) අල්පප්‍රාණ අක්ෂර පමණක් යෙදුණු වරණය තෝරන්න.

(1) ක, ඵ, ණ, ට (2) ක, ච, ට, ධ

(3) ක, ට, ප, හ (4) ක, ත, ද, බ

(04) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) සියළු, නිධාන (2) ස්තූපය, ප්‍රාර්ථනා

(3) ප්‍රස්ථාර, මර්ධනය (4) පරිගණක, ලේඛම්

(05) අකාරාදී පිළිවෙළ නිවැරදි ව දක්වා ඇති පද පේළිය වන්නේ,

(1) බ්‍රහස්පතින්දා, ඉරිදා, සෙනසුරාදා.

(2) කෑගල්ල, ඔරුවල, ගම්පහ.

(3) ළමයා, ගුරුවරයා, පාසල.

(4) මානෙල්, රෝස, සමන්.

(06) 'වත' යන පදයට බහු අර්ථ පදයක් නොවන්නේ,

(1) වේදය (2) වස්තුව (3) මුහුණ (4) වස්ත්‍රය

(07) මුලින් දැක්වෙන පදයට සමානාර්ථ පදයක් වන්නේ,

උතුම්,

(1) උදම් (2) උදාන (3) වර (4) ගර්භය

(08) මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථ පදය නො දෙන පදය කුමක්ද?

සූර්යයා,

(1) තාරපති (2) නිශාපති (3) කලාපති (4) දිනපති

(09) තද්ධිත පදයක් නො වන්නේ,

(1) නැටුම් (2) සාමාජික (3) බුද්ධිමත් (4) කාලීන

(10) වනන්තරේ වන සපු මල් පිපීයන්

''.....දසරාජ ධර්මයෙන් රාජ්‍යය කරනු මැනවි.''

ඉරි ඇඳි පදවල ක්‍රියාව පිළිවෙළින් යෙදී ඇති වරණය කුමක් ද?

(1) මිශ්‍ර ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
(2) ආශිර්වාද ක්‍රියා, විධි ක්‍රියා
(3) ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(4) විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා

- **11 සිට 15 ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන නිවැරදි ව්‍යාකරණ වරණය තෝරන්න.**

(11) තාරකා සියල්ල ම අහසේ ..................

(1) බබළති. (2) බබළයි. (3) බැබළුණෝය. (4) බබළන ලද හ.

(12) අම්මාත්, මමත්, නිවස පිරිසිදු ..................

(1) කළහ. (2) කළෝය. (3) කළේ ය. (4) කළෙමු.

(13) එතනහාමි රස හොද්දක් සාදා නාන්න ..................

(1) ගියා ය. (2) ගියෝ ය. (3) යන ලදී. (4) ගියහ.

(14) .................. ගීතය ගායනා කළා ය.

(1) දැරියක (2) දැරියක් (3) දැරියෝ (4) දැරියන්

(15) නිලධාරීහු .................. ඇමතූහ.

(1) ගොවියෝ (2) ගොවියෙක්
(3) ගොවීන් (4) ගොවීහු

(16) "පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල
විලිකුන් සුරත් පලවැනි වේ රිවි මඬල"

මෙම කවිය ඇතුළත් කෘතිය වන්නේ,

(1) හංස සන්දේශය (2) ගිරා සන්දේශය
(3) පරෙවි සන්දේශය (4) සැළලිහිණි සන්දේශය

(17) "ඉරු දෙව් බබළයි පහන
වලා ඉහළ කෙරෙයි වියන"

මෙම පද්‍යය ලිව්වේ කවුරුන් ද?

(1) මහගමසේකර මහතා (2) කුමාරතුංග මුනිදාස මහතා

(3) එස් මහින්ද හිමි (4) ගුණදාස අමරසේකර මහතා

- 18 - 19 ප්‍රශ්නවලට ඉරි ඇඳි පදවලට ගැළපෙන තේරුම කුමක් දැයි තෝරා යටින් ඉරක් අඳින්න.

(18) " තමන් රැකි තපස් අනුන්ට විකුට දෝ හෙවත් එහි පින් දී <u>ගෙරි සියයකුත්</u>, මසුරන් සියයකුත්, <u>පාද පරිචාරිකා</u> කෙනෙකුත් ලදින් ......."

(1) මසුරන් සියයක්, භාර්යාව

(2) මසුරන් සියයක්, ගමන් කරන රථය

(3) ගවයන් සියයක්, ගමන් කරන රථය

(4) ගවයන් සියයක්, භාර්යාව

(19) "මේ නම් <u>ලෝ</u> ලිය නොම වන්නේ,"

(1) මනුෂ්‍ය කාන්තාව (2) ලෝක ප්‍රසිද්ධ

(3) සිද්ධාංගනාව (4) සුරඟනන්

(20) පහත සඳහන් කවියේ අන්තිම පදය සම්පූර්ණ කරන්න.

අත් වැඩ පර වැඩ සමව සිතන්නේ
මෙත් සිත සව්සත කෙරෙහි කරන්නේ
එත් බැරි නම් තොප සසර ගෙවන්නේ
.............................................................

(1) දුගතියේ වැද තොප කිම දුක් විඳිනේ

(2) විළිවැස්මක් නොව විය දෙව් වුවත් අනේ

(3) සෙත් පුර සැප කෙලෙසක ද ලබන්නේ

(4) සග මොක් දෙන බණ අදහා ගන්නේ

(ලකුණු 2 x 20 =40)

# සිංහල භාෂාව හා සාහිත්‍යය - II

(01) බිත්ති පුවත්පතක පළ කිරීම සඳහා පහත සඳහන් ප්‍රශ්නවලට කරුණු ගොනු කරන්න.

(i) රූපවාහිනියේ හෝ ගුවන් විදුලියේ හෝ ප්‍රවෘත්ති ප්‍රකාශයක අන්තර්ගත වන ඔබ හඳුනාගත් විශේෂ ලක්ෂණ මොනවා ද? විස්තර කරන්න. (ලකුණු 03)

(ii) ඔබ තෝරා ගත් රූපවාහිනී/ගුවන් විදුලි වැඩසටහනක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.(ලකුණු 03)

(iii) කාලීන ප්‍රවෘත්තියක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10යි)

(02)පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150ක පමණ රචනයක් ලියන්න.

(i) ජන කවියේ සුන්දරත්වය
(ii) බස සරසන ලේඛකයෝ
(iii) පොත් කියවීමෙන් දැනුම ලබමු
(iv) මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි
(v) ගම මැදි කරගෙන ගලනා ගංගාවේ අසිරිය (ලකුණු 20)

(03) පහත සඳහන් කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වැලි මාවත් ලෙසින් ඇති ගං හෝ දොළය
උණුසුම උරා බී ගති වැව්වල ජලය
හැම තැන ගසාගෙන යන වියළුණු කොළය
ගිනියම් සුළඟ තුළ ඇති ලෙඩ කර බලය

සැතපුම් විසි දෙකක් දුර පිටිසර ගමක
ඇතින්නියක් සහ පැටවෙක් ගල් වළක
වැටී සිටිති ඉන් පිටවී ගත නොහැක
යන පණිවිඩය ලැබුණේ මේ වැනි දිනක

(i) පරිසරය වෙනසකට භාජනය වී ඇති බව කවියා ප්‍රකාශ කරන්නේ ඇයි?

(ii)''වැලි මාවත් ලෙසින් ඇති ගං හෝ දොළය" මෙම යෙදුම තනි වාක්‍යකින් අර්ථ ප්‍රකාශ වන පරිදි ලියන්න.

(iii)දෙවැනි කවියට අනුව සිදු වූ කරදරය/ අකරතැබ්බය කුමක් ද?

(iv)''වැටී සිටිති" යන පදයෙන් උක්ත වී ඇති පදය කුමක් ද?

(v) උපමාවක් යෙදී ඇති පද්‍ය පාඨය උපුටා ලියන්න. (මුළු ලකුණු 10යි)

(04) ඔබ පාසල් ගෙවත්ත එළවළු, පලතුරුවලින් පෝෂණය වී ඇත. මෙම එළවළු, පලතුරු අලෙවි කර ගැනීම සඳහා ප්‍රජාව දැනුම්වත් කිරීමට සුදුසු දැන්වීමක් පිළියෙල කරන්න.
පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- ඔබ පාසලේ කෘෂිකර්ම අංශය නියෝජනය කරයි
- අලෙවි කරන එළවළු හා පලතුරු වර්ග
- රසායනික පොහොරවලින් තොර වීම
- සහන මිලකට ලබා ගත හැකි වීම
- දිනය සහ වේලාව කැමති පරිදි යොදන්න (මුළු ලකුණු 10යි)

(05) පෙළ පොතේ උද්ධෘත/කවි ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ''......වෙසමුණි උන්නාන්සෙපල්ල.. මං හැම පෝයට ම වී මලු පහ ගානෙ ගෙනත් දෙන්නං ''

(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?

(ආ) කාහට ද? (ලකුණු 02)

(2) ''දවසක් රෑ ටිකක්
ලැබ බී මත් ව මීයෙක්
බළලා වී මතක්
මෙසේ කීයේ උඩඟු වදනක් ''

(අ) මෙම කවිය ඇතුළත් කෘතිය කුමක් ද?

(ආ) එම කෘතිය රචනා කළේ කවුරුන් ද? (ලකුණු 02)

(3) ''පරිසර හිතකාමී කඩදාසි'' යන පාඩමෙහි සඳහන් වන පරිදි

(අ) හස්ත කර්මාන්තය සඳහා භාවිත කරන ප්‍රධාන අමුද්‍රව්‍යය කුමක් ද?

(ආ) ලංකාවේ හස්ත කර්මාන්ත කඩදාසි සඳහා ප්‍රසිද්ධ ව ඇති ප්‍රදේශයක/ ගමක නම ලියන්න. (ලකුණු 02)

(4) 'දීඝායු කුමාරයාගේ වත' උපුටාගත් කෘතිය කුමක් ද? (ලකුණු 02)

(5) ''අවුරුදු සිහිනය'' කෙටි කතාවේ කතුවරයා නම් කරන්න. (ලකුණු 02)